# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 7 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය කාලය : පැය 2

- සැලකිය යුතුයි
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40 කි.
- පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

1) සූත්‍ර පිටකයේ එන ධම්ම පදයට අයත් ගාථා ගණන වන්නේ,
   i. 426
   ii. 423
   iii. 522
   iv. 299

2) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ
   i. පංච ශීලය
   ii. අටසිල්
   iii. දස සීලය
   iv. ආජීව අෂ්ටමක සීලය

3) බුදු රජාණන් වහන්සේ "වෛරයෙන් වයිරය නොසන්සිඳේ... " යන ධම්ම පද ගාථාව දේශනා කළේ.
   i. නන්ද තෙරුන් අරබයාය
   ii. චුල්ලතිස්ස තෙරුන් අරහයාය
   iii. රාහුල තෙරුන් අරහයාය
   iv. ආනන්ද තෙරුන් අරහයාය

4) සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරුන් දක්වා ඇති දිශාව වන්නේ,
   i. නැගෙනහිර දිශාව
   ii. දකුණු දිශාව
   iii. බටහිර දිශාව
   iv. උතුරු දිශාව

5) "ගුරු සිත නොරිඳවා - වේලාව නොවරදවා " මෙම කවිය ඇතුලත් වන්නේ
   i. ලොවැඩ සඟරාවේය
   ii. ගුත්තිල කාව්‍යයේය
   iii. කාව්‍යශේකරයේය
   iv. ලෝකෝපකාරයේය

6) ඥාණවන්තව කටයුතු කළ හා අඥාණවන්තව කටයුතුකළවෙළඳ නායකයින් දෙදෙනෙකු ගැනකියවෙන ජාතක කථාව වන්නේ
   i. වෙස්සන්තර ජාතකය
   ii. තිත්තිර ජාතකය
   iii. ගුණ ජාතකය
   iv. අපන්නක ජාතකය

7) තම අන්ද දෙමාපියන්ට සැලකු කුඩා පුතකු පිළිබඳ කියවෙන ජාකක කථාව වන්නේ
   i. සාම ජාතකය
   ii. මාතුපෝෂක ජාතකය
   iii. අපන්නක ජාතකය
   iv. තිත්තිර ජාතකයය

8) කළගුණ සැලකීමේ අරමුණින් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා තම ජන්ම භූමිය වූ සුනාපරන්තය තෝරා හිමියන් වන්නේ
   i. ආනන්ද තෙරුන්
   ii. පුණ්ණ තෙරුන්
   iii. නන්ද තෙරුන්
   iv. සැරියුත් තෙරුන්

9) තම කුඹුරුවලින් අස්වනු ලබාගැනීමෙන් අනතුරුව එහි පලමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම හැඳින්වෙන්නේ
   i. හීල්දානය ලෙස
   ii. පේරු දානය ලෙස
   iii. අග්‍රශෂ්‍ය දානය ලෙස
   iv. ආමිස දානය ලෙස

10) අලුත් සහලින් දානය පිළියෙල කොට දෙවියන්ට පුදන කොටස හැඳින්වෙන්නේ

i.අක්කියාල ලෙස
ii. දේව පූජාව ලෙස
iii. මුරුතැන් බත් ලෙස
iv. කිරි ආහාර ලෙස

11) තමා වරදින් මිදීම, අන් අය ලවා වැරදි නොකිරීම, වරදට අනුබල නොදීම අයත් වන්නේ
i. ලෝකාධිපති ශීලයට
ii. ධම්මාධිපති ශීලයට
iii. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලයට
iv. අත්ධාධිපති ශීලයට

12) මත් ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් පුද්ගලයාට ශාරීරිකව සිදුවන අයහපත් ප්‍රතිඵලයක් වන්නේ
i. රෝගවලට ලක්වීම
ii. ධනය අහිමිවීම
iii. අපකීර්තියට පත්වීම
iv. නින්දාවට පත්වීම

13) තමන් විසින් උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් වැය කළයුතු බව දක්වා ඇත්තේ
i. වසල සූත්‍රයේය
ii. පත්තකම්ම සූත්‍රයේය
iii. පරාභව සූත්‍රයේය
iv. කරණිය මෙත්ත සූත්‍රයේය

14) දස පුණ්‍ය ක්‍රියාවන් හි "වෘද්ධාපචායන ලෙස දැක්වෙන්නේ
i. වැඩිහිටියනිට සැලකීම
ii. අසරණයන්ට පිහිට වීම
iii. පූජ්‍ය පක්ෂයට සැළකීම
iv. දෙමාපියන්ට සැලකීම

15) පිදිය යුත්තන් පිදීම මංගල කරුණක් ලෙස දැක්වෙන්නේ
i. මහා මංගල සූත්‍රයේ
ii. රතන සූත්‍රයේ
iii.පරාභව සූත්‍රයේ
iv.කරණීය මෙත්ත සූත්‍රයේ

16) කළගුණ සැළකීමේ අගය දැක්වෙන ජාතක කථාව වන්නේ
i. සාම ජාතකය
ii. තිත්තිර ජාතකය
iii. ගුණ ජාතකය
iv. අපණ්ණක ජාතකය

17) සිංහලයා ඉතා විනීතය ආගන්තුක සත්කාරයේ දක්ෂය.... ආදී වශයෙන් ප්‍රකාශ කරනු ලැබුවේ
i. මහගම සේකරය
ii. අනේපිඬු සිටුතුමා
iii. රොබට් නොක්ස් මහතා
iv. කුඩාපොල හිමි

18) කිසියම් සමාජයක අන්‍යෝන්‍ය උපකාරය සහයෝගය ඇතිව සමගියෙන් එක්ව ක්‍රියාකිරීම හඳුන්වන්නේ
i. සහජීවනය ලෙසය
ii. අර්ථචර්යාව ලෙසය
iii. පරාර්ථචර්යාව ලෙසය
iv. සමානාත්මතාව

19) ඔබට පාසල තුළ හොඳම ශිෂ්‍යයා බවට පත්වීමට නම් ඔබ තුළ නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ
i. ඉපවසීම
ii. අවිහිංසාව
iii. සමානාත්මතාව
iv. ගුණමකුවීම

20) කමල් සිතාමතා කපිලට බොරුවක් කීවේය. එය අයත්වන අකුසල කර්මය වන්නේ
i. ප්‍රාණඝාත
ii. අදත්තාදාන
iii. මුසාවාද
iv. පරුෂාවාචා

## 11 කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු ලියන්න.

1) ඔබ පන්ති කාමරයේදී දෙවන වාරය වෙනුවෙන් සිදු කළ ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. ඔබ ඇගයීම සිදුකළ පාඩමේ මාතෘකාව කුමක්ද? (ල 02)
   ii. භූමිකා රංගනය සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් 02 ක් ලියන්න (ල 02)
   iii. භූමිකා රංගනය සඳහා ඔබට ලැබුණු චරිතය කුමක්ද? (ල 02)
   iv. භූමිකා රංගනය තුළදී ඔබ මුහුණදුන් ගැටළු 02 ක් ලියන්න. (ල 02)
   v. භූමිකා රංගනය තුළින් ඔබ ලැබූ අත් දැකීම් 02 ක් ලියන්න. (ල 02)
   vi. භූමිකා රංගනය ඉදිරිපත් කිරීම සඳහා ඔබ සූදානම් වූ ආකාර 02 ක් ලියන්න (ල 02)
   vii. පන්ති කාමරය තුළදීඔබට හිමිවන නායකත්ව අවස්ථා 02 ක් ලියන්න. (ල 02)
   viii. අපන්ණක ජාතකයෙහි නුවණැති සාන්තු නායකයාව ඉපීද සිටියේ කවුද? (ල 02)
   ix. නායකත්ව ගුණාංග 04 ලියන්න. (ල 04)

2)
   i. පංචශීලයෙහි සඳහන් විරතිය හා සමාදානය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 02)
   ii. පංචශීලය සුරැකීමේදී යොමුවිය යුතු අංශ තුන විරතියට අනුව දක්වන්න. (ල 03)
   iii. පන්සිල් සුරැකීමෙන් සමාජයට වන යහපත වාක්‍ය 05 කින් දක්වන්න. (ල 05)

3)
   i. පංචශීලයට  අයත් ආජීව අෂ්ටමක ශීලයෙහි අඩංගු නොවන සිල්පදය ලියන්න. (ල 02)
   ii. ආජීව අෂ්ටමක ශීලයට අයත් පංච ශීලයට අයත් නොවන සිල්පද 03 ක් ලියන්න. (ල 03)
   iii. මිනිසා හා සත්ත්වයා සමාන වන්නේත් අසමාන වන්නේත් කුමන ගති ලක්ෂණ වලින්ද? (ල 05)

4)
   i. අත්තෝච්චි මං අවධි මං

   ----------------------------

   ----------------------------

   වේර තෙසං න සම්මති

   ඉහත ධම්ම පද ගාථාවේ පේලි දෙක සම්පූර්ණ කරන්න. (ල 02)
   ii. එම ගාථාවේ අර්ථය ලියන්න. (ල 03)
   iii. ඉහත ධම්මපද ගාථාවෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න. (ල 05)

5)
   i. සදිසා නමස්කාරය ඇතුළත් සූත්‍ර දේශනාව කුමක්ද? (ල 02)
   ii. එම සූත්‍රයට අනුවගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටුවිය යුතු යුතුකම් වලින් 03 ක් ලියන්න. (ල 03)
   iii. සිසුන්ගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් 5 ක් ලියන්න. (ල 05)

6)
   i. බෝසතාණන් වහන්සේගේ ඉවසීමේ ගුණය ප්‍රකට වන ජාතක කථාවකුමක්ද? (ල 02)
   ii. බුදුරජාණන්වහන්සේගේ ඉවසීමේ ගුණය ප්‍රකට වන අවස්ථා 03 ක් ලියන්න. (ල 03)
   iii. ඉවසීමෙන් ලැබෙන ආනිසංස 5 ලියන්න. (ල 05)

7)
   i. හෙළ බොදු සිරිත් අතරින් 2 ක් ලියන්න. (ල 02)
   ii. වැඩිහිටියන් වෙනුවෙන් කළ හැකි යුතුකම් අතරින් 03 ක් ලියන්න. (ල 03)
   iii. භික්ෂූන්වහන්සේලාගෙන් සමාජයට ඉටුවන සේවාවන් 5 ක් ලියන්න. (ල 05)